# 2. ආයෝජන සහ ඉතිරි කිරීම්

*ආයෝජන අඛණ්ඩ ලෙස ප්‍රසාරණය විය. වසර 2000 දී දළ ආයෝජන රුපියල් බිලියන 368 ක් වෙමින් සියයට 22.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයින් සියයට 78 ක් පෞද්ගලික ආයෝජන වූ අතර ඉතිරිය රාජ්‍ය ආයෝජන විය.*

- ආයෝජන/දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය 2000 වසරේදී සියයට 29.1 ක් විය. මෙය පසුගිය වසරේ සටහන් වූ සියයට 27.2 ට වඩා බෙහෙවින් වැඩිය.
- දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් පෞද්ගලික ආයෝජන 1999 වසරේදී වූ සියයට 20.7 සිට 2000 වසරේදී සියයට 22.8 දක්වා ඉහළ ගිය අතර රජයේ ආයෝජන, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.4 ක් ලෙස තවදුරටත් නොවෙනස්ව පැවතිණ.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් වරාය සේවා, දුරකථන සන්නිවේදන, ගුවන් ගමන්, බලශක්ති, ප්‍රවාහන සහ මහා මාර්ග ඉදි කිරීම් ආදී ක්ෂේත්‍රයන්හි පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයෝජන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලැබිණ.
- දේශීය ඉතුරුම් 2000 වසරේදී රුපියල් බිලියන 224 කි. මෙය පෙර වසරට වඩා සියයට 1.8 ක සුළු වර්ධනයකි.
- පෞද්ගලික ඉතුරුම් සියයට 15.2 ක ඉහළ අනුපාතයකින් වර්ධනය වූ අතර රාජ්‍ය ඉතිරි කිරීම් තවදුරටත් ඍණාත්මකව පැවතිණි.
- පෞද්ගලික ඉතුරුම්/දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය 1999 දී වූ සියයට 20.8 සිට 2000 වසරේදී සියයට 21 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද දේශීය ඉතුරුම්/දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය රජයේ නිර් ඉතුරුම් ඉහළ යාම හේතුවෙන් සියයට 19.8 සිට 2000 වසරේදී සියයට 17.7 දක්වා පහත වැටුණි.
- දේශීය ඉතුරුම් දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය, පහත වැටීම පිළිබිඹු කරමින් ජාතික ඉතුරුම් (දේශීය ඉතුරුම්, ශුද්ධ විදේශීය සංක්‍රාම සහ ශුද්ධ සාධක ආදායමෙහි එකතුව) දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 1999 දී වූ සියයට 23.8 සිට 2000 වසරේදී සියයට 21.7 දක්වා පහත වැටුණි.

ජාතික ඉතිරිකිරීම් සහ ආයෝජන ද.දේ.නි. හි ප්‍රතිශතකයක් ලෙස




*2.1 රූප සටහන*